**ජල සම්පත් මණ්ඩලය - 2015**

**------------------------------------**

ජල සම්පත් මණ්ඩලයේ 2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති හා අනෙකුත් පැහැදිළි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1999 අංක 42 දරන පනතින් සංශෝධිත 1964 අංක 29 දරන ජල සම්පත් පනතේ 17(2) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර මණ්ඩලයේ වාර්ෂික වාර්තාව සමග ප්‍රකාශයට පත්කළ යුතුයැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් සහ නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

**----------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

**--------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 - 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාරධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැළසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළවන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් මණ්ඩලයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) හා (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

**2. මූල්‍ය ප්‍රකාශන**

**2.1 තත්ත්වාගණනය කළ මතය**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2015 දෙසැම්බර් 31 දිනට ජල සම්පත් මණ්ඩලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳව අදහස් දැක්වීම**

**2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති**

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07 ප්‍රකාරව වත්කමක ක්ෂය කිරීම ආරම්භ කළ යුතු වන්නේ එම වත්කම භාවිතා කිරීම සඳහා සූදානම් තත්ත්වයට ගෙන ආ පසුව වුවද මණ්ඩලය විසින් වත්කම් මිලදීගත් වර්ෂය සඳහා ක්ෂය නොකිරීමේ හා ඉවත් කරන වර්ෂයේ දී මුළු වර්ෂය සඳහා ක්ෂය කිරීමේ පදනම අනුගමනය කර තිබුණි.

**2.2.2 ගිණුම්කරණ අඩුපාඩු**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

**(අ)** 2012 වර්ෂයේදී මහා භාණ්ඩාගාරයෙන් හා 2013 වර්ෂයේදී ශ්‍රී ලංකා යුද්ධ හමුදාව හා ජල සම්පත් ලේකම් කාර්යාලය විසින් ප්‍රදානය කළ වාහන 06 ක වටිනාකම අගය කර මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි.

**(ආ)** 2006 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා සේවක අර්ථසාධක අරමුදල් දායකය ගණනය කිරීමේදී ජීවන වියදම් දීමනාව ගණන් නොගැනීම හේතුවෙන් දායක මුදල් රු. 25,268,406 ක් සහ අධිභාර රු. 12,634,203 ක් ගෙවිය යුතු බව සමාලෝචිත වර්ෂයේදී හඳුනාගෙන තිබුණ ද එම වගකීම් ගිණුම්ගත කර නොතිබුණි.

**2.2.3 විගණනය සඳහා සාක්ෂි නොවීම**

එකතුව රු. 12,350,395 ක් වූ ණයගැතියන් සහ සේවා අත්තිකාරම් වලට අදාළ ශේෂ තහවුරු කිරීම් විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

**2.3 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.3,835,577 ක්වූ ණයගැති ශේෂයෙන් වර්ෂ 3 ඉක්ම වූ ණය ශේෂය රු. 212,836 ක් වුවද එම ශේෂ අය කර ගැනීමට ඵලදායී ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සේවා ඉටු කිරීම සඳහා රු.2,707,906 ක සේවා අත්තිකාරම් ලබාගෙන වර්ෂයකට වඩා වැඩි කාලයක් ඉක්මවී තිබුණ ද අදාළ කාර්යයන් ඉටු කර දීමට මණ්ඩලය කටයුතු කර නොතිබුණි. තවද, අදාළ කාර්යය නිම කර තිබුණු රු.96,432 ක අත්තිකාරම් මුදල් නිරවුල් කිරීමට ද කටයුතු කර නොතිබුණි.

**2.4 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

පහත දැක්වෙන අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

| | නීති රීති සහ රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | 1964 අංක 29 දරන ජල සම්පත් මණ්ඩල පනත සහ 1999 අංක 42 දරන සංශෝධිත පනතේ 14(1) සහ 14(3) වගන්ති | පනතේ දක්වා ඇති යම් කරුණක් හෝ සියලු කරුණු පිළිබඳව උපදේශක කමිටුව විසින් මණ්ඩලයට උපදෙස් ලබාදිය යුතු වුවද, සමාලෝචිත වර්ෂයේදී මණ්ඩලයේ උපදේශක කමිටුව රැස්වී නොතිබුණි. තවද සමාලෝචිත වර්ෂය තුළ පැවැත්වූ පර්යේෂණ අධ්‍යයන 11 ක් පිළිබඳව කමිටුවේ උපදෙස් සඳහා එහි අවධානයට යොමු කර නොතිබුණු අතර ඒ සඳහා දරන ලද රු.27,896,000 ක පර්යේෂණ වියදම් ජල සම්පත් මණ්ඩල පනතේ විධිවිධාන ප්‍රකාරව උපදේශක කමිටුව විසින් අනුමත කර නොතිබුණි. |
| (ආ) | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | එකතුව රු. 899,569,000 ක් වූ ජංගම නොවන වත්කම් සඳහා ස්ථාවර වත්කම් ලේඛන පවත්වා නොතිබුණි. |
| (ඇ) | 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 9.7 ඡේදය | භාණ්ඩාගාර ලේකම්ගේ අනුමැතිය ලබා ගැනීමෙන් තොරව මණ්ඩලයේ නිලධාරීන් 29 දෙනෙකුට සමාලෝචිත වර්ෂයේදී රු.2,229,667 ක් සහ ඉකුත් වර්ෂයේදී නිළධාරීන් 17 දෙනෙකුට රු.1,716,000 ක විශේෂ දීමනා ගෙවා තිබුණි. |

**3. මූල්‍ය සමාලෝචනය**

**3.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මණ්ඩලයේ මෙහෙයුම් කටයුතුවලින් රු.99,400,000 ක ඌනතාවයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.39,063,000 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ ඌනතාවය රු.60,337,000 කින් වැඩිවී තිබුණි. මුළු වියදම රු.107,711,000 කින් වැඩිවීම සහ මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ලද ආදායම රු.9,935,000 කින් අඩුවී තිබීම ඌනතාවය වැඩිවීමට ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 04 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2011 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා මූල්‍ය ප්‍රතිඵලයේ ඌනතාවයක් දක්නට ලැබුණි. කෙසේ වුවද සේවක පාරිශ්‍රමික හා ජංගම නොවන වත්කම් සඳහා ක්ෂය සැලකිල්ලට ගැනීමේදී 2011 වර්ෂයේදී රු.97,199,000 ක් වූ මණ්ඩලයේ දායකත්වය, අඛණ්ඩව ධනාත්මකව වර්ධනය වී සමාලෝචිත වර්ෂයේදී රු. 158,170,000 ක් වී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

---------------------------

### 4.1 කාර්යසාධනය

---------------

**(අ) අරමුණු ඉටුකර ගැනීම**

-----------------------------

1999 අංක 42 දරන ජල සම්පත් මණ්ඩල (සංශෝධිත) පනතේ අංක 12 වගන්තියේ දක්වා ඇති මණ්ඩලයේ අරමුණු පහත දැක්වේ.

**(i)** රටේ ජල සම්පත් සංරක්ෂණය සහ උපයෝගීකරණය කිරීම ඇතුළත්ව ඒවා පාලනය කිරීම, විධිමත් කිරීම හා සංවර්ධනය කිරීම හා ජල මාර්ග අපවිත්‍රවීම වැලැක්වීම.

**(ii)** ජල සම්පත් බහුකාර්ය ලෙස සංවර්ධනය හා පරිහරණය කිරීම, ගෘහ කටයුතු හා කාර්මික කටයුතු සඳහා කෙටි කාලීනව හා දිගු කාලීනව ජල සම්පත් ලබාදීම, ලවණතාවය පාලනය කිරීම හා සමාන අරමුණුවලින් රටේ ජල සම්පත් පාලනය හා පරිහරණය පිළිබඳව ජාතික ප්‍රතිපත්ති සකස් කිරීම.

**(iii)** රටේ භූගත ජල සම්පත් සම්බන්ධයෙන් රාජ්‍ය ආයතන මගින් සිදු කරනු ලබන පර්යේෂණ, සංඛ්‍යාත්මක සමීක්ෂණ, සැලසුම් සහ යෝජනා මත පදනම් වූ වාර්තා විශ්ලේෂණය කිරීම.

**(iv)** භූ ගත ජලය නිසි ලෙස පාලනය හා ආර්ථිකමය පරිහරණය සඳහා රජය විසින් ගතයුතු වන වෙනත් ඕනෑම සුදුසු ක්‍රියාමාර්ග ගැනීම.

ඉහත සඳහන් අරමුණු ඉටුකර ගැනීම සඳහා මණ්ඩලය විසින් ප්‍රමාණවත් පියවර ගෙන නොතිබුණි.

**(ආ)** සමාලෝචිත වර්ෂය සඳහා වූ වාර්ෂික ඇස්තමේන්තුව මගින් විෂයයන් 13 ක් යටතේ ඒකක 6206 කට අදාළ පර්යේෂණ අධ්‍යයනයන් ඉටුකිරීමට සැලසුම් කර තිබුණද ප්‍රගති වාර්තා අනුව මණ්ඩලය විසින් ඒකක 2808 ක් පමණක් ඉටුකර තිබූ අතර ඉටු නොකළ සැලසුම් සියයට 16 සිට සියයට 100 දක්වා පරාසයක විය.

**(ඇ) පර්යේෂණ අධ්‍යයන ක්‍රියාත්මක කිරීමේ අඩුපාඩු**

--------------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

**(i)** 2010 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා ජලය පිළිබඳ තත්ත්වය සහ එයින් පොදු ජනතාවට වන බලපෑම පරීක්ෂා කිරීම සඳහා රු.410,181,400 ක ඇස්තමේන්තු පිරිවැයට පර්යේෂණ අධ්‍යයන ව්‍යාපෘති 11 ක් ආරම්භ කර තිබුණු අතර 2015 දෙසැම්බර් 31 දිනට එම මුදලින් රු.84,403,529 ක් වැය කර තිබුණි. මෙම අධ්‍යයන

ව්‍යාපෘති වලින් 09 ක් 2015 දෙසැම්බර් 31 දිනට නිම කිරීමට සැලසුම් කර තිබුණද එම ව්‍යාපෘති 09 ම අපේක්ෂිත පරිදි නිම කිරීමට නොහැකිවීමෙන් ව්‍යාපෘතිවලින් අපේක්ෂිත අරමුණු ඉටුවී නොතිබුණි.

**(ii)** පර්යේෂණ අධ්‍යයන සඳහා වගකීම දරන නිලධාරීන්ගේ පූර්ව පර්යේෂණ පලපුරුද්ද ඔවුන්ගේ අධ්‍යාපනික හා වෘත්තීය සුදුසුකම් අධ්‍යයන යෝජනාවට ඇතුළත්ව නොතිබුණු අතර කිසිදු පර්යේෂණ අධ්‍යයනයක් එම පර්යේෂණ කටයුත්ත සම්බන්ධයෙන් ප්‍රවීන හා පලපුරුදු පර්යේෂකයෙකුගේ අධීක්ෂණයට ලක්වී නොතිබුණි.

**(iii)** පර්යේෂණ අධ්‍යයනයන් සාර්ථකව සම්පූර්ණ කිරීම සඳහා පූර්ණ කාලීනව පර්යේෂණ නිලධාරියෙකු පත්කළ යුතු වුවත් මණ්ඩලය විසින් සියලුම පර්යේෂණ අධ්‍යයනයන් සඳහා පර්යේෂණ නිලධාරී ලෙස මණ්ඩලයේ සාමාන්‍යාධිකාරී පත් කර තිබුණි. ඔහුගේ සාමාන්‍ය රාජකාරීවලට අමතරව පර්යේෂණ අධ්‍යයන සඳහා යොමුවීමට සිදුවී ඇති බැවින් සැලසුම් කරන ලද කාලපරිච්ඡේදය තුළදී පර්යේෂණ අධ්‍යයනයන් නිම කිරීමට නොහැකිවී තිබුණි.

**(v)** සමාලෝචිත වර්ෂයේදී පර්යේෂණ අධ්‍යයනයන් සඳහා භාණ්ඩාගාරය විසින් වෙන් කර තිබුණු ප්‍රතිපාදනවලින් රු.246,161 ක් මණ්ඩලයේ වියදම් සඳහා වැය කර තිබුණි.

## 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

--------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

**(අ)** අවුරුදු 06ක අනිවාර්ය සේවා කාලයකට සහ රු.1,308,699 ක ඇප බැඳුම්කරයකට යටත්ව 2005 වර්ෂයේදී ශිෂ්‍යත්වයකට විදේශගත වූ භූ විද්‍යාඥවරියක ශිෂ්‍යත්වයෙන් පසුව ගිවිසුම්ගත සේවා කාලය සම්පූර්ණ කිරීමට පෙර වර්ෂ 04 ක අනිවාර්ය සේවා කාලයකට සහ රු.435,600 ක ඇප බැඳුම්කරයකට යටත්ව වෙනත් ආයතනයකට මුදාහැර තිබුණි. නිලධාරිනිය බැඳී තිබුණු ගිවිසුම් 02 ට අනුකූලව කටයුතු කර නොතිබියදී 2011 වර්ෂයේ සිට මණ්ඩලයේ සේවයෙන් ස්ථිරවම මුදාහැර තිබුණද ගිවිසුම් ප්‍රකාරව මණ්ඩලයට අයවිය යුතු රු.1,744,299 ක ඇප මුදල සමාලෝචිත වර්ෂය අවසානයටත් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**(ආ)** කරඹ පානීය ජල ව්‍යාපෘතිය යටතේ නළ ළිඳක් ඉදිකිරීමට 2006 වර්ෂයේදී කල්පිටිය ප්‍රාදේශීය ලේකම් විසින් මණ්ඩලයට රු.1,751,358 ක් ගෙවා තිබුණි. නමුත් ඉදිකළ නළ ළිඳෙහි ජලය අධික ලවන ගතියෙන් යුක්තවීම හේතුකොටගෙන මණ්ඩලය විසින් ලබාගත් අත්තිකාරම් මුදලින් එම ප්‍රදේශයෙන් තෝරාගත් නළ ළිං 03 ක පොම්ප පරීක්ෂණය සඳහා වැය කරන ලද රු.536,130 ක මුදල අඩු කර ඉතිරිය වූ රු.1,215,228 ක් නැවත ලබාදීමට මණ්ඩලයේ මෙහෙයුම් කළමනාකරු එකඟ වී තිබුණි. එහෙත් සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම එම මුදල කල්පිටිය ප්‍රාදේශීය ලේකම් වෙත ආපසු ගෙවීමට කටයුතු කර නොතිබුණි.

## 4.3 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

---------------------------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අවසන් තොගය තුළ වටිනාකම රු.66,956,871 ක්වූ අභාවිත හා චලනය නොවන ගබඩා ද්‍රව්‍ය පවතින බව 2013, 2014 සහ 2015 යන වර්ෂවල සමීක්ෂණ මණ්ඩල වාර්තාවලින් හඳුනාගෙන තිබුණද ඒවා සම්බන්ධයෙන් විධිමත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

## 4.4 කාර්ය මණ්ඩල පරිපාලනය

---------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

**(අ)** අනුමත කාර්ය මණ්ඩලය සේවකයින් 365 දෙනෙකු වුවද 2016 ජනවාරි 19 දිනැති අංක ජසම/අවි/32-2016 දරන සභාපතිගේ ලිපියෙන් අනුමත කාර්ය මණ්ඩලය 380 ක් බව විගණනයට සනාථ කර තිබුණි. ඒ අනුව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතියකින් තොරව අනුමත කාර්ය මණ්ඩලය ඉක්මවා 15 දෙනෙකු වැඩිපුර බඳවාගෙන තිබුණි.

**(ආ)** ජල සම්පත් මණ්ඩලයේ බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටියට පටහැනිව 2015 වර්ෂයේදී සේවකයින් 34 දෙනෙකු බඳවාගෙන තිබුණි. එම සේවකයින්ගේ පෞද්ගලික ලිපිගොනු පරීක්ෂා කිරීමේදී තනතුරට අදාළ රැකියා අයදුම්පත් ඉදිරිපත් නොකළ අවස්ථා 06 ක්, රියදුරු තනතුරු වලට බඳවා ගැනීමේදී අවශ්‍ය සුදුසුකම් නොතිබුණු අවස්ථා 02 ක් හා වෛද්‍ය සහතික ඉදිරිපත් නොකළ අවස්ථා 06 ක් වූ අතර ඉදිරිපත්කර තිබූ අධ්‍යාපන සහතික පිටපත් සත්‍ය බවට තහවුරු කරගෙන නොතිබුණි.

**(ඇ)** බඳවාගැනීමේ පරිපාටියට පටහැනිව කාර්යක්ෂමතා කඩඉම් විභාග පැවැත්වීමකින් තොරව මණ්ඩලයේ සේවයේ නියුතු සියලුම සේවකයින්ට වැටුප් වර්ධක හා උසස්වීම් ලබාදී තිබුණි.

## 4.5 විධිමත් පරිදි පවරා නොගත් වත්කම්

-----------------------------------

මණ්ඩලයේ ප්‍රධාන කාර්යාලය, රත්මලාන හා වවුනියාව වැඩපලවල් හා අනුරාධපුර සංචාරක බංගලාව පිහිටා ඇති ඉඩම් සහ ගොඩනැගිලි මණ්ඩලය වෙත පවරා ගැනීමට කටයුතු කර නොතිබුණු අතර එම ඉඩම්වල නව ගොඩනැගිලි ඉදිකිරීම හා පැවති ගොඩනැගිලි නවීකරණය කිරීම ද මණ්ඩලය විසින් සිදු කර තිබුණි.

## 4.6 වෙනත් රාජ්‍ය ආයතන වෙත ලබා දුන් මණ්ඩලයේ සම්පත්

--------------------------------------------------------

2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 8.3.9 වගන්තියට පටහැනිව මණ්ඩලයේ කාර්යභාරය ඉටු කර ගැනීම සඳහා බඳවාගත් පාලන කළමනාකරු (කොන්ත්‍රාත්), කාර්මික නිලධාරි, කම්කරු, රියදුරු, කාර්යාල කාර්ය සහායක දෙදෙනෙකු ඇතුළු 06 දෙනෙකුගෙන් සමන්විත කාර්ය මණ්ඩලයක් ජල සම්පත් මණ්ඩලයේ කාර්යන්ගෙන් බැහැර වෙනත් රාජ්‍ය ආයතනවල රාජකාරී සඳහා මුදාහැර තිබුණු අතර සමාලෝචිත වර්ෂයේදී එම සේවකයින්ට ගෙවූ රු.816,897ක වැටුප් හා දීමනා මණ්ඩලය මගින් දරා තිබුණි.

## 5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

--------------------------------------

## 5.1 අභ්‍යන්තර විගණනය

අභ්‍යන්තර විගණන අංශයක් ස්ථාපිත කර තිබුණ ද තාක්ෂණ හා ඉංජිනේරු ශිල්පක්‍රම භාවිතා කරන මණ්ඩලයේ කාර්යයන් විගණනය කිරීමට සුදුසුකම්ලත් නිලධාරීන් ප්‍රමාණාත්මක සංඛ්‍යාවක් අනුයුක්ත කර නොතිබුණි.

## 5.2 අයවැය ලේඛනමය පාලනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

**(අ)** අයවැයගත ආදායම් සහ වියදම් තථ්‍ය ආදායම් සහ වියදම් සමඟ සැසඳීමේදී අයිතම 176 ක සියයට 20 සිට සියයට 810 ක් වූ පරාසයක විචලනයන් වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස උපයෝගී කරගෙන නොමැති බව නිරීක්ෂණය විය.

**(ආ)** අයවැය ලේඛනය පිළියෙල කිරීමේදී චුන්නාකන් (Chunnakan) ව්‍යාපෘතියේ ආදායම හඳුනාගෙන නොතිබුණු අතර සමාලෝචිත වර්ෂය තුළදී රු.1,800,000 ක ආදායමක් එමගින් ලැබී තිබුණි.

## 5.3 වාර්ෂික වාර්තා සභාගත කිරීම

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.3 වගන්තිය ප්‍රකාරව ගිණුම් වර්ෂය අවසන්වී දින 150 ක් ඇතුළත වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු වුවද 2012 සහ 2013 යන වර්ෂවලට අදාල වාර්ෂික වාර්තා 2016 ජුලි 31 දින වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

## 6. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු මණ්ඩලයේ සභාපතිවරයාගේ අවධානයට වරින් වර යොමු කරන ලදී.පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමුකළ යුතුවේ.

| පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|
| (අ) ගිණුම්කරණය | රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුව කටයුතු නොකිරීම, වත්කම් පවරා ගැනීමට කටයුතු නොකිරීම. |
| (ආ) මෙහෙයුම් පාලනය | අපේක්ෂිත පරිදි මූල්‍ය හා භෞතික කාර්යසාධනය අත්පත් කර ගැනීමට කටයුතු නොකිරීම, සැලසුම්කළ පරිදි පර්යේෂණ අධ්‍යයන නිම කිරීමට කටයුතු නොකිරීම. |
| (ඇ) ණයහිමි සහ ණයගැති පාලනය | නිරවුල් කිරීමට ඵලදායී ක්‍රියාමාර්ග නොගැනීම. |

| | | |
|---|---|---|
| **(ඇ)** | වත්කම් පාලනය | ජංගම නොවන වත්කම් ලේඛනගත කිරීමට කටයුතු නොකිරීම. |